# ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත් කැඳවීම - 2025 මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සිදු කිරීම

1. 2025 වර්ෂය සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස් කර ඇති මාර්ගගත අයදුම්පත් මඟින් පමණක් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් කිරීම අනිවාර්යය වේ.

2. මාර්ගගත අයදුම්පතට පිවිසීම සඳහා https://nspt.moe.gov.lk දිගුව භාවිත කරන්න.

3. මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා අදාළ උපදෙස් සංග්‍රහය https://nspt.moe.gov.lk දිගුව තුළ ද දක්වා ඇත.

4. අයදුම්පත් යොමුකළ හැකි කාලසීමාව 2025.03.01 දින සිට 2025.03.14 දින දක්වා වේ. අයදුම්පත්‍රය ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පිරවිය යුතුය.

5. මාර්ගගතව සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පතෙහි මුද්‍රිත පිටපත නිවරදිව සහතික කර Scan කිරීමෙන් පසු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් මාර්ගගත පද්ද්තියට Upload කිරීමෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. අයදුම්පතෙහි සහතික කරන ලද පිටපත් අමාත්‍යාංශයට භාර ගන්නා අවසාන දිනට පෙර (2025.03.25) අදාළ මාර්ගගත පද්ධතියට යොමු කිරීමට හැකිවන පරිදි කල්වේලා ඇතිව තම අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත භාර දීම ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වගකීම වනු ඇත. පෞද්ගලිකව අමාත්‍යාංශය වෙත එවනු ලබන ස්ථාන මාරු අයදුම්පත් කිසිඳු දැනුම්දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

6. වෛද්‍ය හේතු ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම්, වෛද්‍ය සහතිකය අයදුම්පත්‍රයට අමුණා ඉදිරිපත් කළ යුතු වේ. මේ සඳහා වෛද්‍ය සහතික PDF ආකාරයෙන් පරිලෝකනය කර පද්ධතියට උඩුගත කිරීම ප්‍රමාණවත් වේ. වෛද්‍ය සහතික කිහිපයක් තිබේ නම් එම සහතික සියල්ල තනි PDF ගොනුවක් ලෙස පරිලෝකනය කර (Scan) පද්ධතියට උඩුගත කිරීම සෑහේ. වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේදී පිළිගත් රජයේ වෛද්‍යවරයෙකු විසින් අදාළ රෝගී තත්ත්වය සනාථ කරමින් ඉදිරිපත් කරන වෛද්‍ය සහතික පමණක් පිළිගනු ලබන අතර, ඖෂධ වට්ටෝරු හෝ සායනික සටහන් හා විවිධ වෛද්‍ය පරීක්ෂණ වාර්තා වෛද්‍ය සහතික ලෙස භාර නොගන්නා බව අයදුම්කරුවන් විසින් සැලකිය යුතුය.

7. ඉහත 6 යටතේ යොමු කරන ලිපි ලේඛන හැර වෙනත් බාහිර පාර්ශවයන්ගේ නිර්දේශ සහිත ලිපි අයදුම්පත්‍රයට ඇමිණීමෙන් වැළකී සිටින ලෙස දන්වා සිටිමි. එසේ අමුණා එවීමෙන් විශේෂ වරප්‍රසාදයක් හිමිනොවන බවද සැලකිය යුතුය.

8. අයදුම්පත්‍රය අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් පසු එවන කිසිඳු ඇමුණුමක් භාර ගනු නොලැබේ. අතිරේක ලිපි ලේඛන අමාත්‍යාංශය වෙත වරින් වර ඉදිරිපත් කිරීම විදුහල්පති සේවයේ නිලධාරීන් විසින් සිදු නොකළ යුතුය.

- අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කිරීම හා මුද්‍රිත පිටපත නියමිත දිනට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත භාර දීම නිලධාරීන්ගේ වගකීම වේ.
- භාර ගන්නා අයදුම්පත් සියල්ල නිලධාරීන් වෙත නිකුත් කර ඇති උපදෙස් මාලාවට අනුකූලව විදුහල්පති හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව අදාළ උපලේඛන සමඟ නියමිත දිනට පෙර අදාළ මාර්ගගත පද්ධතියට උඩුගත කිරීම (Upload) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වේ.

9. මේ සම්බන්ධයෙන් යම් ගැටළුවක් පවතී නම් principalbranchnew@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ 0112-784827 / 0112-786252 යන අංකවලට දැනුම්දිය හැක.